# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1922/26 - 2015 ජූලි මස 08 වැනි බදාදා - 2015.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2011.

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

11 වන වගන්තිය යටතේ නියමය

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය කබීර් හෂීම් වන මා විසින්, ඉහත කී පනතේ 9 වන වගන්තිය යටතේ සාදනු ලැබූ සහ 2015 ජුනි මස 26 වන දින අංක 1920/36 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් ''අධිවේගී මහා මාර්ගයක්'' බවට ප්‍රකාශයට පත් කරන ලද පිටත වටරවුම් ජාතික මහා මාර්ගයේ කොට්ටාව - කඩවත කොටස ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක්'' විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබේ.

එකී පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද ''පිටත වටරවුම් ජාතික මහා මාර්ගයේ කොට්ටාව - කොතලාවල කොටස (කි.මී. 0.000 සිට කි.මී. 9.900 දක්වා)'' අධිවේගී මහා මාර්ගයක් බවට ප්‍රකාශයට පත් කරමින් 2014 පෙබරවාරි මස 19 වන දිනැති අංක 1850/33 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගති විරහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

කබීර් හෂීම්,<br>
මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2015 ජූලි මස 07 වැනි දින,<br>
බත්තරමුල්ලේ දී ය.

**උපලේඛනය**

***ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සමන්විත වන ප්‍රදේශය***

පිටත වටරවුම් ජාතික මහා මාර්ගයේ කොට්ටාව - කඩවත කොටස ලෙස නම් කර ඇති අධිවේගී මහා මාර්ගයේ කොට්ටාව අන්තර් හුවමාරුව (කි.මී. 0.000) සහ කඩවත අන්තර් හුවමාරුව (කි.මී. 19.245) අතර පිහිටා ඇති කිලෝ මීටර් 19.245 ක් දිගින් සහ මීටර් 40.000 - 75.000ක් පළලින් යුතුව විහිදෙන මාර්ගයේ කොටස වේ.

07 - 1083


1A - PG 2541 — 306 (2015/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*